බදුල්ල දිස්ත්‍රික්කයේ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීම 1982 ජූලි මාසයේදී ආරම්භ විය. මීට අරමුදල් සපයන්නේ කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර අරමුදල සහ ස්වීඩන් ජාත්‍යන්තර සංවර්ධන ආයතනය යන මූලාශ්‍ර දෙක මගිනි. මෙම වැඩපිළිවෙලයන්හි අපේක්ෂිත යෝජනා ක්‍රම කාලච්ඡේදය වන අවුරුදු පහ සඳහා ඇස්තමේන්තු කරන ලද පිරිවැය රුපියල් දශ ලක්ෂ 406 ක් වේ. මේ වැඩපිළිවෙල යටතේ කුඩා තේ ඉඩම් සංවර්ධනය, සෞඛ්‍ය සහ අධ්‍යාපන පහසුකම් වැඩි දියුණු කිරීමට ද ඉහළ ප්‍රමුඛතාවයක් දෙනු ලැබ ඇත. මින් 1984–86 කාලච්ඡේදය තුළදී පසුව සඳහන් කල කාර්යයන් දෙක උදෙසා වන මුළු වියදම ස්වීඩන් ජාත්‍යන්තර සංවර්ධන ආයතනයෙන් ලැබෙන දීමනාවක් මගින් දරනු ඇත.

**සේවා නියුක්තිය**

1983 වර්ෂයේදී රාජ්‍ය සහ රාජ්‍ය අනුබද්ධිත යන අංශ දෙකෙහිම සේවා නියුක්තිය වැඩිවිය. සේවක අර්ථසාධක අරමුදල් දත්තයන් මත පදනම් වී ඇති පෞද්ගලික අංශයේ සේවා නියුක්තිය පිළිබඳ අවසාන ඇස්තමේන්තු මේ දක්වා ලැබී නොමැත. සංවිධානය නොවූ පෞද්ගලික අංශයේ සහ විදේශ ආයෝජන පදනම් කර ගත් පෞද්ගලික අංශයේ ව්‍යවසායයන්හි සේවා නියුක්තිය වැඩි වී ඇති බව පෙනේ.

රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය 1983 දී 4,670 කින් වැඩිවී ඇත. සේවා නියුක්තියේ සියයට 1 ක්වූ මෙම ආන්තික වැඩිවීම සිදුවූයේ රජයේ වියදම් අඩුකිරීමේ තීරණයක් පවා තිබියදීය.

රාජ්‍යඅනුබද්ධිත අංශයේ සේවා නියුක්තිය වැඩිවූයේ සියයට 0.2 කින් පමණකි. මෙය 1982 වසරේ වර්ධනයට වඩා මඳක් අඩුය. 1982 වර්ෂයේ වැඩිවීම සියයට 0.5 ක් විය. ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලය (ශ්‍රී.ලං. ග. ම.) සහ ධීවර සංස්ථාව වැනි සමහර රාජ්‍ය අනුබද්ධ ආයතන ක්‍රියාත්මක වියදම් කපාහැරීමේ අදහසින් ගෙන යන සේවක සංඛ්‍යාව අඩුකිරීමේ ප්‍රතිපත්ති මෙයට හේතු විය. සේවක අර්ථසාධක අරමුදලේ ක්‍රියාකාරී ගිණුම් මත පදනම් වූ සංවිධානය වූ පෞද්ගලික අංශයේ සේවා නියුක්තිය පිළිබඳ 1983 වසරේ අවසාන ඇස්තමේන්තු මේ වනතුරු ලැබී නොමැත. කෙසේ වෙතත් නියත සංඛ්‍යාලේඛන ඇති මේ හා සම්බන්ධ විදේශීය ආයෝජන අංශයෙහි සේවා නියුක්තියේ වැඩිවීමක් පෙන්නුම් කරයි. 1983 දී මහ කොළඹ ආර්ථික කොමිසමෙහි (ම. කො. ආ. කො.) සේවා නියුක්ති 3,779 කින් වර්ධනය විය. තවද වසරේ මුල් භාගය තුළදී විදේශ ආයෝජන උපදේශක කමිටුව (වි. ආ. උ. ක.) මගින් අනුමත කරන ලද ව්‍යාපෘතීන්හි ඇති කරනු ලැබූ නව රැකියා ගණන 4,865 ක් විය. මෙසේ 1977 සිට 1983 දක්වා කාලය තුළ ඇති කරන ලද මුළු රැකියා ගණන 26,944 කි.

පුද්ගලික අංශයේ සෑහෙන ප්‍රමාණයක් ඇතුළත්, සංවිධානය නොවූ කාර්යයන් වන සම්ප්‍රදායික කෘෂිකර්මය, ඉදිකිරීම් සහ ස්වයං රැකියා වැනි දේ පිළිබඳ සංඛ්‍යා තොරතුරු ලබා ගැනීමට නොමැත. කෙසේ වෙතත් විමසීමට භාජනය කරනු ලබන වර්ෂය තුළදී මෙම අංශයන්හි සිදුවී ඇති ආර්ථික වර්ධනය අනුව සේවා නියුක්ති වර්ධනයක්ද සිදුවී ඇතැයි යන අදහස සනාථ කිරීමට ප්‍රමාණවත් කරුණු ඇත.

බොහෝවිට සේවා නියුක්තියේ මෙබඳු වර්ධනයක් සිදුවීමට ඉඩ ඇත්තේ වී වගාව, පතල් සහ කැණීම්, වෙළඳ සහ පෞද්ගලික ප්‍රවාහනය යනාදී අංශයන්හිය. වී වගාව යටතට පත් අක්කර ප්‍රමාණය සියයට 7 කින් වර්ධනය වී ඇති අතර එම අංශයේ සියයට 14 ක වර්ධනයක් සිදුවී ඇත.

ගමනා ගමන, පතල් සහ කැණීම් සහ වෙළඳ අංශ පිළිවෙලින් සියයට 5, 8 සහ 5 වර්ධනයක් වාර්තා කරයි. 1.31 සංඛ්‍යා සටහනෙහි දැක්වෙන අයුරු 1978 සිට සේවා නියුක්තියෙහි කැපී පෙනෙන වැඩිවීම් සිදුවී ඇත. මේ වර්ධනයේ වැඩි කොටසක් පෞද්ගලික අංශයේ වන අතර,

රාජ්‍ය අනුබද්ධ හා රාජ්‍ය දෙපාර්තමේන්තු වලද වැඩිවීම වාර්තාගතය. කෙසේවෙතත් පසුගිය පස් වසරේ වාර්ෂික වර්ධන අනුපාතයන්ට අනුව වැඩිවූ සේවා නියුක්තියේ සැහෙන වර්ධනයන් මුල් තුන්වසර තුළ පැනනැගුණු බැව් පෙන්වන අතර, ඉන්පසු නව සේවා නියුක්ති අවස්ථාවල වර්ධනයේ සම තත්ත්වයක් දක්නට ලැබුණි.

**1 . 31 සංඛ්‍යා සටහන**

**රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ සේවා නියුක්ති ඇස්තමේන්තු**

| වර්ෂය | රාජ්‍ය අංශය | | පෞද්ගලික අංශය | | එකතුව |
|---|---|---|---|---|---|
| | රාජ්‍ය | රාජ්‍ය අනුබද්ධ | ම.කො.ආ.කො. | අනෙකුත්[1] | |
| 1977 .. | 422,647 | 617,033 | — | 283,427 | 1,323,107 |
| 1978 .. | 446,085 | 681,034 | 261 | 321,690 | 1,449,070 |
| 1979 .. | 470,188 | 749,034 | 5,876 | 310,096 | 1,535,194 |
| 1980 .. | 476,086 | 769,122 | 10,538 | 348,597 | 1,604,343 |
| 1981 .. | 481,475 | 778,199 | 19,729 | 348,365 | 1,627,768 |
| 1982 .. | 484,802 | 784,370 | 24,926 | 320,753 | 1,614,851 |
| 1983 .. | 489,472 | 785,717 | 28,705 | ල·නො· | ල·නො· |

මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව සහ මහ කොළඹ ආර්ථික කොමිසම.

1. පදනම සේවක අර්ථසාධක අරමුදල් දත්තයන්ය.

පාරිභෝගික මුදල් සහ සමාජ ආර්ථික සමීක්ෂණයෙන් සොයාගත් පරිදි දැනට පවතින සේවා නියුක්ති තත්වයෙන් පෙන්වන්නේ, සේවා වියුක්ති අනුපාතය 1978/79 දී සියයට 14.8 සිට 1981/82 දී සියයට 11.7 දක්වා අඩුවී ඇති බවයි. මෙම සේවා නියුක්ති අනුපාතය මෑත දශකයන් තුළ වාර්තාවූ අඩුම මට්ටම වේ.

## මිල

1983 වර්ෂයේ මිල හැසිරීමෙහි ප්‍රධාන ලක්ෂණය වූයේ, පසුගිය වර්ෂ දෙක තුළ දක්නට ලැබූ මිල අඩුවීමේ ප්‍රවනතාවයට ප්‍රතිපක්ෂ වීමකි. අලෙවි කිරීමේ මූලික අවස්ථාවලදී මෙන්ම, සිල්ලර අලෙවි අවස්ථාවලදී ද මිල වැඩිවීමේ ප්‍රමාණයෙහි වර්ධනයක් දිස්විය.

ඉකුත් දෙවසරෙහි දිස්වූ මිල අඩුවීමේ ප්‍රවනතාවයට ප්‍රතිපක්ෂ වූ මෙම තත්ත්වය කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකයෙන් මෙන්ම තොග වෙළඳ මිල දර්ශකයෙන්ද පැහැදිලි වෙයි. 1982 වර්ෂයේ සියයට 10.8 ක වැඩිවීම හා සසඳන විට, 1983 වර්ෂයේ කොළඹ පාරිභෝගික–යන්ගේ මිල දර්ශකයේ වාර්ෂික සාමාන්‍යය ඉකුත් වර්ෂයේ සාමාන්‍යයට වඩා සියයට 14 කින් වැඩිවිය. 1982 වර්ෂයේ සියයට 5.5 ක්වූ වැඩිවීම සමග සැසඳීමේදී, 1983 දී ශ්‍රී ලංකා මහ බැංකුවේ තොග වෙළඳ මිල දර්ශකයේ අදාළ වැඩිවීම සියයට 25 කි. එසේ වුවද, 1983 දී කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකයේ වර්ධන ප්‍රමාණය 1980 සහ 1981 වර්ෂවලට වඩා අඩු ය.

1983 වර්ෂයේ මිල මට්ටමෙහි වැඩිවීමේ ඉහළ වර්ධන අනුපාතය, හේතුන් කීපයක ඒකා–බද්ධ ප්‍රතිඵලයකි. අපනයන භාණ්ඩයන්ගේ තියුණු මිල වැඩිවීම මගින් දේශීය වෙළඳපොළෙහි එම ද්‍රව්‍යයන්ගේ මිල වැඩිවීමක් ඇති කරන ලදී. පිරිවැටුම් සහ දුම්කොළ බදුවල ආරෝහන ප්‍රතිශෝධනයද, වැඩිවූ ප්‍රවාහන ගාස්තු සහ විශේෂයෙන්ම භූමිතෙල් ඇතුළු අත්‍යවශ්‍ය පාරි–භෝගික භාණ්ඩවල මිලෙහි ආරෝහන ප්‍රතිශෝධනයන්ද මෙහිලා මිල මට්ටම් අවධාරණය කිරීමට දයක වූ අනෙක් ප්‍රධාන සාධකයන්ගෙන් සමහරෙකි.